**ඒඩ්ස් ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය නව මූල්‍යයන ආකෘතිය යටතේ මැලේරියා සංරචකය - 2018**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ නව මූල්‍යයන ආකෘතිය යටතේ මැලේරියා සංරචකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 898-එල්කේජ්-එම්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘතියේ කාලය

---

ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයවීමේ නියෝජිත ආයතනය වේ. ශ්‍රී ලංකාව තුළ මැලේරියා මර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මැලේරියා නව මූල්‍යානය ආකෘතිය නමින් මැලේරියා සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 921.28 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 7.05 ක් වන අතර එය ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව පිළිබඳ ගෝලීය අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද ,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1. නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | (අ) සලසා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, උපරිම අනුමත සීමාව වූ රු.100,000 ඉක්මවා අවස්ථා 38 කදී එකතුව රු.මිලියන 12.30 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | අදාළ රෙගුලාසි සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්ට අනුකූල නොවීම. | අදහස් දක්වා නැත. | අනුමත උපරිම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ආ) අදාළ කාර්ය සඳහා අවශ්‍ය ආසන්නතම දිනයේදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 19 කදී එකතුව රු.828,300 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නියමිත දිනට මාස 02 සිට මාස 07 දක්වා කාලයකට පෙර නිකුත් කර තිබුණි. | - එම - | අදහස් දක්වා නැත. | අත්තිකාරම් ගෙවීම නිශ්චිත අරමුණට පෙර දිනට ලබා දිය යුතු අතර ප්‍රමාදයකින් තොරව පියවිය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මැලේරියා නව මූල්‍යයන ආකෘතියේ යාවත්කාලීන කරන ලද ප්‍රගතිය පිළිබඳ සටහන් හා වියපැහැදම් ඉල්ලීම්වලට අනුව, වර්ෂ 03 ක කාලය තුළදී අයවැය පිරිවැය කාණ්ඩ 12 ක් යටතේ අයවැය ක්‍රියාකාරකම් 190 ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. අයවැය ක්‍රියාකාරකම් 23 ක් යටතේ රු.මිලියන 155.610 | අරමුණු ඉටුකර නොගෙන අරමුදල් ඉතිරි කිරීම. ඒඩ්ස් මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ නව මූල්‍යයන ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් සංරචකයේ යාවත්කාලීන කරන | අදහස් දක්වා නැත. | අපේක්ෂිත අරමුණු සපුරාලීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| කට සමාන එක්සත් ජනපද ඩොලර් 957,357 ක් ප්‍රතිපාදනය කර තිබුණු බව හා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 36.53 කට සමාන එක්සත් ජනපද ඩොලර් 224,723 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, අයවැය පිරිවැය කාණ්ඩ 08 ක් යටතේ වෙන් කරන ලද රු.මිලියන 9.03 කට සමාන එක්සත් ජනපද ඩොලර් 55,613 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 12.08 කට සමාන එක්සත් ජනපද ඩොලර් 74,325 ක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණි. | ලද ප්‍රගතිය පිළිබඳ සටහන් |

## 3.2 උපයෝජනය නොකළ සම්පත්

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලද තොරතුරු අනුව, ව්‍යාපෘති කාලය තුළ උපයෝජනය කිරීමට අපේක්ෂිත රු.මිලියන 921.28 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 7.05 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 874.50 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 5.54 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. තවද, ගෝලීය අරමුදලෙන් ප්‍රතිපූර්ණය කරන ලද රු.මිලියන 16.33 කට සමාන එක්සත් ජනපද ඩොලර් 320,364 ක් උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානයේ දී මහා භාණ්ඩාගාරයේ තිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල පාර්ශවකරුවන් වෙත ළඟා නොවීම. | අදහස් දක්වා නැත. | අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව, අන්වීක්ෂ ප්‍රසම්පාදනය, තොරතුරු සඳහා ද්‍රව්‍ය සැපයීම, අධ්‍යාපනය සහ සන්නිවේදන කටයුතු ඇතුළු ක්‍රියාකාරකම් 08 ක් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 35.12 කට සමාන එක්සත් ජනපද ඩොලර් 216,122 කට නිම කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී නිම කර නොතිබුණි. | -එම - | අදහස් දක්වා නැත. | -එම - |
| (ඇ) | 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාව මැලේරියාවෙන් තොර රටක් ලෙස ප්‍රකාශයට පත් කර ඇතත්, ප්‍රකාශයට පත් කර වර්ෂ දෙකකට පසුව රෝගය යළිත් ඉහළ යාමට පටන් ගෙන ඇත. 2016 සිට 2018 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ 41 සිට 57 ක් දක්වා අවස්ථාවලදී මැලේරියා රෝගීන් සොයා ගෙන තිබුණි. මැලේරියා ව්‍යාප්ත වූ රටවලින් සංක්‍රමණයවන්නන් සම්බන්ධ සිද්ධීන් සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | රට තුළ මැලේරියාව පැතිරීම. | අදහස් දක්වා නැත. | රට තුළ මැලේරියාව පැතිරීම අවම කිරීමට පියවර ගත යුතුය. |

**3.3** **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| ------------------------ | ------------- | ----------------- | ---------------- |
| ඒඩ්ස් ක්ෂය රෝග සහ මැලේරියා මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදලේ මැලේරියා නව මූලායයන සංරචකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත | නීති හා රෙගුලාසිවලට අනුකූලවීමට අසමත් වීම. | අදහස් දක්වා නැත. | විගණකාධිපතිවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත වෙනම විගණන වාර්තාවක් නිකුත් කර තිබුණු අතර එමඟින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශකර තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා විගණකාධිපතිගේ අභිමතය විමසා නොතිබුණි.

**3.4 පද්ධති සහ පාලන**

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 414.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් 2,270,091 ක වත්කම් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | වත්කම්වල භෞතික පැවැත්ම මැනිය නොහැකිවීම. | අදහස් දක්වා නැත. | ව්‍යාපෘතියේ වත්කම් භෞතික සත්‍යාපනය කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ගනුදෙනු සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයක් සිදුකර නොතිබුණි. | මූල්‍ය පාලනය දුර්වල වීම. | අදහස් දක්වා නැත. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. |